// ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,328 — 1937ක්වූ ඔක්තෝබර් මස 29 වෙනි දිනවූ සිකුරාදා.

# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## උපනීති.

### බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901 ආඥාපනත.

මන්නාරමේ සනීපාරක්ෂක සභා සම්බන්ධ ආඥාපනතේ බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ 5වෙනි වගන්තිය යටතෙහි මන්නාරමේ සනීපාරක්ෂක සභාව විසින් සම්පාදනය කරනලද උපනීති.

සී. සිත්තම්පලම්,
සනීපාරක්ෂක සභාවේ සභාපතිතැන,
මන්නාරම් දිස්ත්‍රික්කය.

වර 1937ක්වූ ජූලි මස 12වෙනි දින
මන්නාරමේ සනීපාරක්ෂක සභා කාර්යාලයේදීය.

1. මන්නාරමේ සනීපාරක්ෂක සභාවේ සභාපති යනු; මන්නාරමේ සනීපාරක්ෂක සභාවේ ප්‍රධාන තැනයි. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ මුදල යනු; ආඥාපනතේ 5වෙනි වගන්තියේ ප්‍රකාර අවුරුදුපතා ලියාපදිංචිකිරීම සඳහා සනීපාරක්ෂක සභාවට ගෙවියයුතු මුදලයි.

බල්ලෙකුගේ අයිතිකාරයා යනු; ඒ බල්ලාගේ ස්වාමියායි.

2. අවුරුදුපතා බල්ලන් ලියාපදිංචිකිරීම වෙනුවෙන් සනීපාරක්ෂක සභාවට ගෙවියයුත්තේ පහත සඳහන් ප්‍රකාරයි.

බල්ලන්ගේ පිරිමි සතෙකුට සත 25යි.
බල්ලන්ගේ ගැණු සතෙකුට සත 50යි.

3. මෙම මුදල් බල්ලන්ගේ ස්වාමියන් නොහොත් අයිතිකාරයන් විසින් අවුරුද්දේ මැයි මස 1වෙනි දිනට ප්‍රථම සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැනට ගෙවිය යුතුයි.

4. එම මුදල් ගෙවූ පසු සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන විසින් ලියාපදිංචිකල බවට සහතිකපත්‍රයක් සහිත අංක සාදනලද ලෝහමය තහඩුවක් හෝ පටියක් දෙනු ලැබේ. එසේහත් සනීපාරක්ෂක සභාවේ සභාපතිතැන වෙත බල්ලා පිළිබඳ මනා විස්තරයක් ඉදිරිපත් නොකොලොත් ඉහතකී සහතිකපත්‍ර ලෝහමය තහඩු හෝ පටි නොදී සිටීමටද අවකාශ තිබේ.

5. තවද බල්ලා දඩාවතේ යෑමට ඉඩකැර තිබේනම් හෝ ඌට කෙරෙහි වැඩි සැලකිල්ලක් නොදක්වා සිටිනම් හෝ බෝවන රෝගයකින් පෙළේනම් දෙනලද සහතිකපත්‍රාදිය අවලංගුකිරීමට සනීපාරක්ෂක සභාවේ සභාපතිතැනට බලය තිබේ.

6. ඉහත දක්වූ කරුණු අනුව යම් කිසි බල්ලෙකු වෙනුවෙන් දෙනලද සහතිකපත්‍ර ආදිය අවලංගු කලපසු එම බල්ලන් වෙනුවෙන් සභාපතිතැනගේ අදහස් පරිදි ක්‍රියාකිරීමට ඉඩ තිබේ.

7. සියළුම බල්ලන් වෙනුවෙන් ලියාපදිංචිකල ඔවුට දෙනලද ලෝහම යන තහඩු හෝ පටි ඒවා වලංගු කාලය තුළ බල්ලන්ගේ කරේ තිබිය යුතුයි.

8. බල්ලන් සම්බන්ධ නීති හරියාකාර පිළිපදිනලෙස බල්ලන්ගේ ස්වාමියන් වෙත තමන්ට කැමති විදියට දැනුම්දී සිටීමටද සභාපතිතැනට වැඩිදුරටත් බලය තිබේ.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,638 (අනුරාධපුර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් හෝ එකී ඉඩමෙන් යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1937ක්වූ ඔක්තෝබර් මස 29වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒවා කටයුතුකරන බවද එකී ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1937ක්වූ ඔක්තෝබර් මස 6වෙනි දින අනුරාධපුර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ජේව්වත්ස්,
උ. ම. දි. මහා ඒජන්තතුමා.

(a) මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ මහා ඒජන්තතුමාගෙන්ද, එහි සිටියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, එම ඉඩමට අයිතිකම් කීම හැටියට බාරගනු ලැබේ.

## උප ලේඛනය.

උතුරු මධ්‍යම දිසාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර වටුබතුල (U. D. C. Limits) තිසාවැව යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත දක්වන මායිම් තුල බිම්කට්ටිය, එනම්:—

උතුරට: අනුරාධපුර නගරේ මුල් සිතියමේ (F. S. P. P. 55) සදහම් 24A බිම්කට්ටිය සහ (T. S. P. P. 14B) සිතියමේ 9B බිම්කට්ටි දෙකද;

නැගෙණහිරට: එම සිතියමේ 7, 9C, 8, 13 සහ 9 දරණ බිම්කට්ටිද;

දකුනට: එම සිතියමේ 9වෙනි බිම්කට්ටිය;

බස්නාහිරට: (F. S. P. P. 55) සදහම් පලෑනේ 9වෙනි බිම් කට්ටියද වේ.

නුවරගම් තහනම් මූකලාන පිළිබඳ සඳහා තිබෙන නො. 55 දරණ පලෑන.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 24 | තිසාවැවකැලේ .. | .. 97 1 5 |

---

### 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,639 (කෑගල්ල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩමේ කිසිවක් හෝ ඒ ඉඩමේ යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 29වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මාවෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 6වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. අලුවිහාර,
කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(a) මෙම ඉඩමේ ගැණ වැඩිදුර තොරතුරු කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිය.

(b) මෙකී ඉඩමට උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

## උප ලේඛනය.

මෙහි පහත විස්තර වෙනෙන සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල්කෝරලේ කීරවැලි නැගෙනහිර පත්තුවේ දුදිගම යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටිය, එනම්:—

මුල් සිතියමේ නො. පී. පී. ඒ. 119.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 6 | කොටසිහාරදගැබ .. | .. 1 1 7·3 |

මීට මායිම්—උතුරට: පී. ඇන්. පුන්චිගුරා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන මීගහමූලවත්ත (A 119 මුල් සිතියමේ 2වෙනි බිම්කට්ටිය) සහ ආණ්ඩුවේ කහටගහවත්ත (A 119 මුල් සිතියමේ 3වෙනි බිම්කට්ටිය);

නැගෙනහිරට: ආණ්ඩුවේ කහටගහවත්ත (A 119 මුල් සිතියමේ 3වෙනි බිම්කට්ටිය සහ පී. ඇම්. හෙන්දිරික් සිංඤෝ සහ තවත් අය විසින් අයිතිකම්කියන විහාරගෙවත්ත (A 119 මුල් සිතියමේ 4වෙනි බිම්කට්ටිය);

දකුණට: පී. ඇම්. හෙන්දිරික් සිංඤෝ සහ තවත් අය විසින් අයිතිකම්කියන මිනිහෝනවත්ත (A 119 මුල් සිතියමේ 5වෙනි බිම්කට්ටිය);

බස්නාහිරට: පී. ඇන්. පුන්චිගුරා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන මීගහමූලවත්ත (A 119 මුල් සිතියමේ 2වෙනි බිම්කට්ටිය).

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Anuradhapura No. 178.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස දහවෙනි දිනවූ සිකුරාද පෙරවරු 10ට මිහින්තලේ ගම්සභා නඩු ශාලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බද්දට දෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ සිංහල, එගොඩ සහ මැදපත්තුවල තම්මන්කඩු කොරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 20ක්.

මුල් සිතියමේ නො. අයි. ඇස්. පී. පී. 6. ගම—මිහින්තලේ. අයිතිකම්කියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | පවපිලිකන්දෙවත්ත .. | මිහින්තලේ පදිංචි එච්. ඒ. පොඩිසිංඤෝ අප්පුහාමි | පොල්ගස් සහ මැටියෙන් සාදනලද ගෙයක් ඇති වතු ඉඩම | 1 | 3 | 27 | 41 |
| 6 | මිල්ලගහවත්ත නොහොත් පවපිලිකනෙ හේන | මිහින්තලේ පදිංචි රංහාමිගෙ පිකිරිඅප්පු | තාවකාලික ගොවිතැන් හා මැටියෙන් සාදනලද ගෙයක් ඇති වතු ඉඩම | 0 | 3 | 28 | 41 |
| 10 | වෙලන්ගහවත්ත .. | මිහින්තලේ පදිංචි ලේකම්ගෙ ජුලිහාමි .. | පොල්පැල, කෙසෙල් පඳුරු සහ මැටියෙන් සාදනලද ගෙයක් ඇති වතු ඉඩම සහ හේන | 1 | 0 | 24 | 31 |
| 11 | යල්පැන්නුඹේයාය .. | මිහින්තලේ පදිංචි ඒ. ඇම්. උක්කුබණ්ඩා ආරච්චි | පොල්පැල ඇති වතු ඉඩම සහ කුඹුර | 11 | 0 | 11 | 31 |
| 19 | එම .. | එම | අලුත එළිකල ඉඩම .. | 0 | 0 | 4 | 31 |
| 102 | පවපිලිකනෙකුඹුර .. | මිහින්තලේ පදිංචි බී. ඇස්. පුංචිනෝනා | කුඹුර .. | 2 | 0 | 18 | 31 |
| 29 | මීගහයායහේන .. | නැසීගිය ජී. පී. ඇල්. කරුනාරත්නගෙ උරුමක්කාරයෝ වන මිහින්තලේ පදිංචි (1) කළුබෝවිලගෙ ඇග්නස් ගුනසේකර, (2) ගල්බොඩ පසිකලගෙ දර්මදාස කරුනාරත්න (3) ගල්බඩ පසියකලගෙ දර්මසේන කරුනාරත්න | තාවකාලික වැවිලි සහ මැටිගසනලද ගෙයක් ඇති වතු ඉඩම, කුඹුර, අලුත එළිකල ඉඩම | 8 | 3 | 36 | 35* |
| 31 | ගල්කන්දවත්ත .. | මිහින්තලේ පදිංචි ගමගෙ ජේම්ස්අප්පු .. | තාවකාලික වැවිල්ලක්, ගලක් සහ මැටියෙන් සාදනලද ගෙයක් ඇති වතු ඉඩම සහ කුඹුර | 3 | 0 | 8 | 31 |
| 115 | සරිකෙත .. | මිහින්තලේ පදිංචි යූ. බී. ඉලන්ගසිංහ .. | වතු ඉඩම, අලුත එළිකල ඉඩම සහ කුඹුර | 18 | 1 | 2 | 31 |
| 104 | පවපිලිකනෙමූකලාන | මිහින්තලේ පදිංචි ආර්. ඒ. හැන්රි කුරේ | කැලෑව .. | 1 | 2 | 4 | 31 |
| 105 | ගල්ගොඩයාය .. | එම .. .. | පොල්පැල තිබෙන වතු ඉඩම සහ කුඹුර | 5 | 1 | 24 | 31 |
| 114 | ගලඋඩයායමූකලාන සහ පවපිලිකනෙමූකලාන | එම .. .. | අලුත එළිකරපු බිම .. | 2 | 1 | 28 | 31 |
| 112 | මීගහවත්ත .. | තුප්පහිගෙ පොඩිඅප්පුහාමි .. | පොල්පැල සහ කෙසෙල් පඳුරු ඇති වතු ඉඩම | 1 | 3 | 38 | 31 |
| 108 | නුගගහවත්ත .. | මිහින්තලේ පදිංචි බී. බී. උක්කුබණ්ඩා .. | අලුත එළිකරපු බිම .. | 1 | 2 | 18 | 31 |
| 109 | ගල්වලේවත්ත .. | මිහින්තලේ පදිංචි යූ. බී. අප්පුරාල .. | පොල්පැල තිබෙන වතු ඉඩම | 0 | 2 | 34 | 31 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 53 | රෝන්ගහවත්ත .. | නෑබඩ, වරකාගොඩ පදිංචි පී. දිසානායක | පොල්පැල සහ මැටියෙන් සාදනලද ගෙවල් 3ක් ඇති වතු ඉඩම | 9 | 1 | 27 | 31 |
| | | මුල් සිතියමේ නො. ඇෆ්ජ්. පී. පී. 9. ගම— කිරිතලේ. | | | | | |
| 651½ | පලගහවත්ත සහ කිරතලේමූකලාන | අනුරාධපුරයේ පදිංචි ඇල්. ඇල්බට් අප්පුහාමි | කැලෑ, හේන්, කුඹුර යනාදිය | 9 | 3 | 38 | 30* |
| | | ගම—තෝප්පවැව. | | | | | |
| 650 | සිරිංකත .. | තෝප්පවැවේ පදිංචි කිරගෙ සුන්දරා .. | කුඹුර සහ අලුත එලිකළ ඉඩම | 2 | 3 | 4 | 31* |
| | | ගම—කිරිතලේ. | | | | | |
| 411 | පලුගහවත්ත .. | කිරිතලේ පදිංචි ජී. පී. එච්. මාටින් ද සිල්වා | හේන .. .. | 3 | 3 | 9 | 30* |
| | | මුල් සිතියමේ නො. ඇෆ්ජ්. පී. පී. 12. ගම—කටුවන්විල. | | | | | |
| 271 | බව්වියන්දමුල්වායල්, බව්වියන්දමුල්කන්ඩ සහ අරපට්ටගෙඩ | කටුවන්විල පදිංචි කුලන්ද රොබ් උපහාමි වට විදානෙ සහ ගෙසියදින් පිච්චෙ බම්බ කන්ඩු | කුඹුර, අලුත එලිකරනලද කිඹ සහ කැලේ | 30 | 0 | 0 | 30* |

* මේ බිම්කට්ටි නොවිනැත්කිරීමේ බදු ඔප්පු පිට බදුදී තිබේ. බදුකාරයින්ට ඒවා ගබිරුම්කරනු ලැබේ.

මේ සියලුම බිම්කඩ්ඩවලට වතුරගැනීම් පුලුවන් නිසා ඒවාට රුපියල් 4 බැගින් දිය බදු අයකරනු ලැබේ. එය උවමනා විටෙක වෙනස්කරන්ට බලය තිබේ.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර තොරතුරු උතුරු මැද පලාතේ අනුරාධපුරයේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ ප්ලෑන් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර් 1937ක්වූ ඔක්තෝබර් මස 25වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

වී. කුමාරස්වාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර් 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර් 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්යඅවශ්‍යතාකට, එනම්:—අඹතලාවේ ගමට සොහොන් භූමියක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර් 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ සරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියමකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

නො. 109වේ ගම් සිතියමේ 1වෙනි කොටස. ගම—අඹතලාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 30 | ඇටඹගහමුලලන්ද, හොර ගොඩයාලන්ද | අවුරුදු 2ක පමණ පොල්ගස් 3ක් ඇති හේන | තිහියාගල බිබිරිගොඩගමගේ පොඩිහ් පැලිස් අප්පුහාමි | 0 | 2 | 39·9 |
| 31 | එම .. | හේන .. .. | එම .. .. | 0 | 0 | 4·3 |
| 32 | මල්ලිකාවත්ත .. | අවුරුදු 40ක පමණ තේවත්ත .. | මස්කෙලියේ ආර්. වී. ජේ. කරුපසිසා පිල්ලේ | 0 | 0 | 14·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහැකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර් 1937ක්වූ නොවැම්බර් මස 23වෙනි දින උදේ 9ට කනිසමට තිහිගත්ගේන් ගවිසහාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ යොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර් 1937ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින මහනුවර කච්චේරියේදීය.

එච්. සී. කොක්ස්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

වර් 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර් 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්යඅවශ්‍යතාකට, එනම්:—නාවලපිටියේ බැක්ලේන් ස්කීම් යන කුඩා බාවනක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර් 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ සරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියමකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 414. ගම—නාවලපිටියේ නාගරික සභා සීමාතුල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2 | නාගරික නො. 8 දරන බිමේ කොටසක් | හුනු බදමෙන් තනනලද කාපයක්ද, කානුවක් සහ වතුර බක්කියක් ඇති හිස්ඉඩම | නාවලපිටියේ ඇන්. ජේ. තොන්නා ගොමනොමේ | 0 | 0 | 0·75 |
| 3 | නාගරික නො. 7 දරන බිමෙන් කොටසක් | හුනු බදමෙන් තනනලද කානුවක් සහ කාප්පයක් ඇති හිස්ඉඩම | නාවලපිටියේ අයි. ඇල් ඇම්. ෂෙරීෆ් | 0 | 0 | 0·33 |
| 4 | නාගරික නො. 6 දරන බිමේ කොටසක් | එම .. .. | නාවලපිටියේ බී. ඇම්. ද සිල්වා හෝනා මහත්මි | 0 | 0 | 0·83 |
| 5 | නො. 108වෙනි නාගරික නොම්මරය දරන බිමේ කොටසක් | හුනු බදමෙන් තනනලද කානුවක් ඇති හිස්ඉඩම | නාවලපිටියේ ජේ. ජේ. ඇම්. මොහිදීන් මීරා සයිබු | 0 | 0 | 0·97 |
| 8 | නො. 111කේ නාගරික නොම්මර දරන බිමේ කොටසක් | එම .. .. | නාවලපිටියේ හින්දු කෝවිලේ භාරකාරයින් | 0 | 0 | 3·89 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහැකර තිබෙන මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර් 1937ක්වූ නොවැම්බර් මස 23වෙනි දින උදේ 11ට කනිසමට නාවලපිටියේ නාගරික කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ යොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර් 1937ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින මහනුවර කච්චේරියේදීය.

එච්. සී. කොක්ස්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

වර්ෂ 1876ක් වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගල්පලක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A. 421. ගම—පලිපාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අඹුගේහේවත්ත .. | අවුරුදු 25ක කොස්ගසක්ද, උළු සෙවිලිකරනලද ගොඩනැගිල්ලක් ඇති වත්ත | පලිපානගේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ පුංචිබන්ඩාද, එම අප්පුහාමිද, එම රන්මැණිකාද, එම මුතුමැණිකාද | 0 0 27·1 |
| 2 | එම .. | අවුරුදු 25ක කොස්ගස් 2ක්ද, පරන පුවක්ගස්ද, ගලක සහ පාරක කොටසක්ද ඇති වත්ත | එම .. | 0 3 19·2 |
| 3 | එම .. | වත්ත සහ පාරක කොටසක් .. | එම .. | 0 0 13·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක් වූ නොවැම්බර් මස 24වෙනි දින උදේ 9ගේ කනිසමට ඇහැලගස්ගින්නේ පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි තරම අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක් වූ ඔක්තෝබර් මස 26වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. සී. ජොන්ස්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක් වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පල්ලෙගම වසමට සොහොන්භූමියක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 411. ගම—පල්ලෙගම පහලගම්මැද්ද.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගුරුකැටේවත්ත .. | අවුරුදු 10ක පොල්ගසක්ද, අවුරුදු 10–20 පමන දෙඩන්ගස් 2ද, අවුරුදු 20ක කොහොකාවාගස් 5ද, අවුරුදු 5ක කපුගසක්ද, අවුරුදු 10ක දෙහිගසක්ද, අවුරුදු 2ක පැපොල්ගස් 16ද, අවුරුදු 4ක කපුගස් 2ද, අවුරුදු 10ක පේර ගස් 8ක්ද ඇති වත්ත | පල්ලේගම පහලගම්මැද්දේ පදිංචි ඇම්. ආර්. දූමපාල, ඇම්. ආර්. ජේමවතී, ඇම්. ආර්. කල්‍යාණවතීද වන ඇම්. ආර්. පුංචා හොරාහාත් ගුණසේකරගේ බාලවයස් ලමයින්ද, බණුගේ ස්ත්‍රී ඇම්. ආර්. සීලවතීද, පල්ලේගම පහලගම්මැද්දේ ඇම්. ආර්. හපුමලීද, කොළඹ වුල්ෆැන්ඩෝල් වීදියේ නො. 242 කේ. ඇජ්. මුතුකුමරු හාමේ ඇම්. සෝමසුන්දරද | 0 2 36·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක් වූ නොවැම්බර් මස 30වෙනි දින උදේ 8ට කනිසමට වලල ආණ්ඩුවේ බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරෙම අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක් වූ ඔක්තෝබර් මස 26වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. සී. ජොන්ස්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක් වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කිරහන්දිගොඩ ප්‍රසිද්ධ වැසිකිලියක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 535. ගම—කිරහන්දිගොඩ (හික්කඩුවේ සනීපාරක්ෂක සභාවේ බාසිම්තුල).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මහකම්මලේවත්ත, වර්පනම් නොම්මර 303 කොටසක් | අවුරුදු 20 පුවක්ගස් 1, අවුරුදු 2 දෙහිගස් 1 ඇති ඉඩම | හික්කඩුවේ පදිංචි (1) කේ. බී. බස්තියන්, (2) කේ. බී. අන්දිරිස් සිල්වා, (3) ඒ. බී. පුංචිහොන්, (4) පී. ඇල්. ඒ. මැන්වෝහාමි, (5) වී. ඩබ්ලිව්. එච්. ද සිල්වා, (6) ඇම්. ඒ. විලියම් සිංඤෝ, (7) ඩී. සී. ඒ. ජෝනිස්හාමි, (8) ඩී. සී. ඒ. ලැයිසාහාමි, (9) ඩී. සී. ඒ. ආදිරිස් සිල්වා, (10) ඇස්. කරෝලිස් සිල්වා, (11) කේ. එච්. කාරොළුඅප්පු, (12) ආර්. ඇස්. ජයවර්ධන, (13) ඩී. ඇස්. ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන සහ (14) ඩී. ජී. ද සිල්වා | 0 0 5·9 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ලියවිල්ලකින් බලය ඇතිව ක්‍රියාකරණ අය වර්ෂ 1937ක් වූ නොවැම්බර් මස 30වෙනි දින පෙරවරු 10ගේ කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක් වූ ඔක්තෝබර් මස 20වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. හින්ග්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ හොම්බර 3වෙනි ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට; ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දෙරපෙ පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියමාකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 654 (උපුටාගන්නාලද කොටස). ගම—දෙරපෙ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | ඔහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සබලන්ගෙවත්ත .. | අවුරුදු 40 පොල්ගස් 12, අවුරුදු 20 පුවක්ගස් 65, අවුරුදු 20 අඹගස් 2, අවුරුදු 5 දෙල්ගස් 1, අවුරුදු 5 දෙහිගස් 1, අවුරුදු 5 පේරගස් 2, අවුරුදු 5 වෙරළුගස් 1, අවුරුදු 3 නාරන්ගස් 1, අවුරුදු 3 අගෝද්දගස් 3, අවුරුදු 3 කජුගස් 1, අවුරුදු 3 කැන්දගස් 4, අවුරුදු 3 කජුගස් 1, අවුරුදු 3 ජම්බුගස් 1, අවුරුදු 3 දොඩංගස් 5, අවුරුදු 1 පුවක්ගස් 66, අවුරුදු 1 කෙසෙල් පඳුරු 12, තාවකාලික මැටි ගොඩනැගිලි 2ක් සහ පිදුරුම්බුවක් ඇති ඉඩම | දෙරපෙ පදිංචි ඒ. ගුණසේකර | 0 1 36·4 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියමාකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ලියවිල්ලකින් බලය ඇතිව ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 30වෙනි දින පෙරවරු 10.30ට කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ එම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. හින්ග්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ හොම්බර 3වෙනි ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කපුහේන්පොල ගම්සභා පාර පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" 6වෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියමාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 536. ගම—කපුහේන්පොල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | ඔහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කැකුණගහවත්ත .. | අවුරුදු 40 පොල්ගස් 22, අවුරුදු 40 ගොඩපර ගස් 19, අවුරුදු 40 පුවක්ගස් 70, අවුරුදු 25 කිතුල්ගස් 2, අවුරුදු 20 ලාවලුගස් 1, අවුරුදු 20 බැදිදෙල්ගස් 2, අවුරුදු 20 කම්පොන්තගස් 1, අවුරුදු 12 රබර්ගස් 1, අවුරුදු 12 මිල්ලගස් 1, අවුරුදු 12 කජුගස් 2, අවුරුදු 12 ඊරියගස් 1, අවුරුදු 3–8 පුවක්ගස් 5, අවුරුදු 10 ගොරකගස් 1, අවුරුදු 3 දොඩංගස් 1, අවුරුදු 3 දවටගස් 1 සහ අභිපාරක කොටසක් ඇති ඉඩම | (1) කොටගොඩ පදිංචි දියෝනිස් ගොඩගෙ, (2) කොටගොඩ පදිංචි පේදුරු ගොඩගෙ, (3) ගනේගොඩ පදිංචි ඔබුත් ගොඩගෙ, (4) ලේල්වල පදිංචි හින්නිහාමි ගොඩගෙ, (5) කපුහේන්පොල ඒ. ජේ. කොරනේලිස්, (6) කොළඹ ඩී. ඩී. ඇස්. අබේවික්‍රම | 0 1 12·9 |
| 2 | කැකුණගහවත්තඔම්ට | අවුරුදු 15 පොල්ගස් 5, අවුරුදු 8 ගොඩපරගස් 2 සහ අභිපාරක කොටසක් ඇති පොල් ඉඩම | එම .. | 0 0 5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියමාකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ලියවිල්ලකින් බලය ඇතිව ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පෙරවරු 10ට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ එම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 22වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. හින්ග්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ හොම්බර 3වෙනි ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඇල්පිටියේ ඉංග්‍රීසි ආරොග්‍යශාලාවේ දෙවෙනි පෙළේ මුලාදෘනියාගේ නිවාසය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියමාකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 571. ගම—පැලැන්දගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | ඔහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කහඹිලියගොඩමාහන .. | අවුරුදු 20 පරණ වැමිල්ලක් ඇති කුරුඳු ඉඩම, අවුරුදු 20 කොස්ගස් 2 සහ මැටි ගෙයක්ද තිබේ | (1) බලපිටියේ ඩී. සී. විජේගුණවර්ධන හෝනා මහත්මි, රන්දෙඹේ පදිංචි, (2) එච්. ඒ. ඇම්. කරුණාරත්න, (3) එච්. ඒ. ඇම්. කරුණාරත්න, (4) එච්. පී. ඇම්. කරුණාරත්න | 0 2 0·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියමාකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ලියවිල්ලකින් බලය ඇතුව ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පෙරවරු 10.30ට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ එම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 21වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. හින්ග්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්: උතුමෝදර විහාරා මිශ්‍ර පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් හිසිආකාර ඔට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

පිතියමේ නො. A 573. ගම—උතුමෝදර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කුරුගොඩවත්ත .. | අවුරුදු 30 කොස්ගස් 2, අවුරුදු 30 පොල් ගස් 21, අවුරුදු 15 අඹගස් 1, අවුරුදු 4 දිවුල්ගස් 2, කුනුබඳුම ගොඩනැගිලි දෙකක් සහ ලිඳක්ද ඇති ඉඩම | ගාල්ලේ කොටුවේ ඩී. ඇස්. ගුණසේකර | 0 2 16 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ලියවිල්ලකින් බලය ඇතිව ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පෙරවරු 11ට කතිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අතුලේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 21වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. ගින්ග්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

———

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—නුන්ගොමුවේ සිංහල විහාරා පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් හිසිආකාර ඔට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

උපුටාගත්තාලද 1වෙනි කොටස. මුල් පිතියමේ නො. 416. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනිහත්පත්තුවේ උඩුකහ නැගෙනහිර කෝරලේ උඩුමුල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 46 | කොට්ටගහමුලවත්ත සහ මකුල්ල ගහකොටුවේවත්ත | පොල්වත්ත .. | (1) නුන්ගොමුවේ ඇම්. රංහාමි, හිටපු ආරච්චි, (2) විල්ගොමුවේ ඇස්. බී. විල්ගොඩුව, ලේකම් | 0 3 0·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 25වෙනි දින පස්වරු 2.30 කතිසමට පොල්ගහවෙල තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අතුලේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. එච්. බී. මැන්ඩර්ස්,
වයඹ පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

## වැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 1194

ආණ්ඩුවේ බදු විකිණීම.

මෙහි සඳහන් ලේඛනයේ දක්වන ආණ්ඩුවේ බදු පහත දක්වන කොන්දේසිවලට යටත්ව, වර්ෂ 1938ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුද්දකට විකිණීම සඳහා ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙසින් දන්නුම්දෙනු ලැබේ.

2. මුද්‍රාකරණලද මෙම ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 19වෙනි සිකුරාදා දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙණ එදිනදී කඩාබලනු ලැබේ. ඉල්ලුම්පත්‍ර කැඩූබව බලනුවිට ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ ඉල්ලුම් කරන්නා හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටිය යුතුයි. ලේඛනයේ දෙවෙනි කොටුවේ දක්වන ප්‍රකාර ඉල්ලනු ලබන බද්දේ නම පිටිකවරවල සලකුනුකොට ඉල්ලුම්පත්‍ර නොහොත් "වැණ්ඩර්ස්" එක එක බද්දට වෙන් වෙන් වශයෙන් එවිය යුතුයි.

කොන්දේසි.

1. බදුමිල වෙන්දේසි දිනේදී සම්පූර්ණයෙන් ගෙවන්ට ඕනෑය.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් කානු, මායිම්ගල් ආදිය වෙනස් කරන්ටවත් ගස්වල එල ද්‍රව්‍ය හැර වෙන කිසියම් දෙයක් ඉඩමෙන් පිට ගෙන යැම්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

3. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩමේ බද්ද යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදු දෙන්ටවත් ගැණුම්කාරයාට අවසර නැත.

4. ගැණුම්කාරයා විසින් ඉඩම් සුද්දෙන් සහ හොඳකාරයෙන් තබාගැනීම්වත් නාගරික සභාවේ අණපනත් අනුව ක්‍රියාකරන්ටත් ඕනෑය. තවද සියලුම වරිපනම් ගෙවන්ටත් ඕනෑය.

5. මුළු ඉඩම හෝ, ඉඩමෙන් යම් කොටසක් හෝ, එහි වැවෙන ගස් ආදිය හෝ ආණ්ඩුවට ඕනෑකලොත්, සුමානයක් කල් දුන්විට එවැනි ඉඩම හෝ ඉඩම් කොටස හෝ ගස් ආදිය හෝ ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්ට යෙදෙන ඉඩමට, ඉඩම් කොටසට හෝ ගස්වලට ගෙවන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගෙවන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවනු ලැබේ.

6. ඉහත සඳහන් කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා ගැණුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් හෝ ගෙවලින් අයක්කර නැවත භුක්තියට පැමිණෙන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

7. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ඩබ්ලිව්. ඊ. හොබ්ඩේ,
බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 29වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ඉහතකී බදුවල විස්තර ලේඛනය.

| කඩදාසි නො. | බද්දේ විස්තරය. | පිහිටීම. |
|---|---|---|
| L. H. 1194 .. | වැල්ලම්පිටිය පාරට අයිති භූමියේ තණකොළ කපා ගැනීම | වැල්ලම්පිටිය |
| L. H. 1195 .. | කොටලහ වික්ටෝරියා පාලමේ කොළඹ පැත්තේ පාර දෙපැත්තේ බිමේ තණකොළ එකතුකිරීම, (වැලිල්ලේ මායිමටත් පාර කණියේපතුළටත් අතර දැනට වෙන්කර තිබෙන තහනම් භූමි කැබැල්ලට කිසිවක් කළයුතු නොවේ) | කොටලහ |
| L. H. 1203 .. | මහා ආයුර්වේද ශාලාව ඉදිරිපිට තිබෙන ආණ්ඩුව විසින් මිලයට ගත් "රිච්ක්ලා" නමැති ගෙය පිහිටි වත්තේ තිබෙන පල දරන පොල් ගස් 23ක්ද, පල නොදරන පොල්ගස් 3ක්ද, පුවක් ගසක්ද, ජම්බුගසක්ද යනාදියේ ප්‍රයෝජනය ගැනීම | මරදාන |

## දිස්ත්‍රික් රෝඩ් කොමිටි පිළිබඳ දැන්වීම.

වර්ෂ 1938, 1939 සහ 1940වත් නුවරකලාවිය දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ සාමාජිකයින් වශයෙන් තෝරාගැනීමට ඉල්ලුම්කාරයින් හැටියට ඉදිරිපත්වීමට කැමති අයින් සවිත්නම් තෝරාගැනීමේ දිනට අඩුගණනේ දවස් 10කට පෙර එසේ බැංදත්ව අදහස්කරණ අය ඒ බව දන්වා අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමන් වෙත ලියවිලි වලින් දැනුම්දිය යුතුබව වර්ෂ 1861කේ නොම්බර 10 දරණ ආඥාපණතේ 26වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

2. ඉහතකී ආඥාපණතේ 27වෙනි වගන්තියේ ප්‍රකාර වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 27වෙනි දින පෙරවරු 10ටට අනුරාධපුර කච්චේරියේදී නුවරකලාවිය රෝඩ් කොමිටියට සාමාජිකයින් තුන්දෙනෙක් තෝරාගනු ලැබේ.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
උ. මැ. ප. ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 25වෙනි දින
අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේදීය.

වර්ෂ 1938, 1939 සහ 1940වත් තමන්කඩුව පලාතේ දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ සාමාජිකයින් වශයෙන් තෝරාගැනීමට ඉල්ලුම්කාරයින් හැටියට ඉදිරිපත්වීමට කැමති අයින් සිටිත් නම් තෝරාගැනීමේ දිනට අඩුගණනේ දවස් 10කට පෙර එසේ බැංදත්ට අදහස්කරණ අය ඒ බව දන්වා අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමන් වෙත ලියවිලි වලින් දැනුම්දිය යුතුබව වර්ෂ 1861කේ නොම්බර 10 දරණ ආඥාපණතේ 26වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

2. ඉහතකී ආඥාපණතේ 27වෙනි වගන්තියේ ප්‍රකාර වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පස්වරු 2කට පොළොන්නරුවේ ගම්සභා උසාවියේදී තමන්කඩුව පලාතේ රෝඩ් කොමිටියට සාමාජිකයින් තුන්දෙනෙක් තෝරාගනු ලැබේ.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
උ. මැ. ප. ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 25වෙනි දින
අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.